## විශ්වාසය හා පතිවත

අද උසාවි දවස අවසන් නඩු වාරය
නුඹ එයි කළු කලිසමට
අත් දිග සුදු කමිසෙත් ඇඳගෙන
වැක්ස් කරපු කොණ්ඩය උස මහත ගාණට
මං වශී වුණෙත් ඇස් කඩා හැලෙන
නුඹේ ඔය පිරිමිකමට
තාත්තෙක් කියලා කියන්නත් බෑ
අදටත් කඩවසම්
ගැටවර සංදියේ වාගේ ම

දෑ අවුරුද්දකට ඉස්සර බෙල්ලන්විල
පන්සලේ දී පෝය සවසක
හා හා පුරා ඔය ඇස් දෙක දැක්කා ලුහු බඳින
අපූරුව මා පසු පස්සෙ ම
ගණන් නොගෙන ගියත් මග හැර
කවුද හිතුවේ ඉරණම් ගමනක් යන්න
එදා මා පසු පස්සෙ වැටුණු වග

කොහේ හරි ලියවිලා තියෙන්න ඇති
අප ආයේ හමු විය යුතු ම බව
පුදුමය කියන්නේ ඒ හමු වීමත්
සිද්ධ වුණේ බෙල්ලන්විල දී නොසිතූ වෙලාවක
අපිටයි බැරි වුණේ අපේ ජීවිත සැලසුම් කර
ගන්න
ඒත් දෛවය සැලසුම් කර තිබුණා හැමදේ ම

අද වාගේ මතක යි නුඹෙ යි මගෙ යි
දැඟිලි බැඳුණු ඒ මංගල දවස
වාසනාවන්ත ම මනාලි මං
එදා නම් හිතුණේ එහෙම
අද හිතෙන්නෙ ම පෙර කළ කරුමයක්
පල දුන්නා කියල ම යි නිතර ම

රෝස පෙති විසුළ යහනේ නුඹ
මා සතපවද්දී දරා ගනු බැරි වුණා
අනුරාගය ඔය දෑස්වල
ලස්සන ම හෝරා කිහිපයක
නිමාව සටහන් කළේ නුඹ
හිස් මුදුනේ තියපු කෙටි හාදුව

රෑ දැක්ක මනමාල බැල්ම වෙනුවට
තරහින් පුපුරනවා උදේ පාන්දර
නොතේරුණ හින්දා ම වෙනසට හේතුව
බලා සිටියා නුඹ දෙස ඇසිපිය නොසලා ම
සෙමෙන් ඔය දෑස සයනය පුරා දුවනකොට
වැටහුණා වෙනසට හේතුව
සුදු රෙද්දේ පාට වෙනස් නොවීම
තිබුණා පෙර දා එලා තිබූ විදියට ම

තුන් හිත ම නුඹෙ නමින් ම  පේ වෙලා
ගොඩ ගැහී  තිබූ  විශ්වාසය
අසුරු සැණින් නුඹ කොහොම ද
සින්න වෙන්න ඉඩ හැරියේ
විජාතික ජපන් කොඩියට

9 772950 655005

වාසනාවට හෝ අවාසනාවට
නුඹේ හුස්මත් පණ ගැහෙන්න
පටන් අරන් එදා ම මා කුස තුළ
දැන ගද්දී සතිය යි හරියට ම කලලයට
ඒ වෙද්දිත් නුඹ මා වෙසඟනක් කර
අවසන් වචන මොට ද එක බැල්මක්
ඇති මට ඔය හිත කියවන්න

දිවුර දිවුරා කීවත් නිවැරදි බව
හෘදය  සාක්ෂිය විතර ම යි දැන උන්නේ
ඇත්ත ඇති සැටියෙන් ම
නුඹට ඕනි වුණේ ම වෙන් වෙන්න
කසාද සහතිකේ උණුහුම යන්නත් කලින් ම
දික්කසාදයට ලිපිය ගෙනත් දුන්නා
මා දෝතට ම

නුඹේ ලෙයටවත් ඉටු කළේ නෑ සාධාරණය
අදටත් දරුවා අවජාතකයෙක්
තාත්තෙක් ඉද්දි ම

සුදු පිරුවටයට මනින්න හැකි
වුණා නම් කුමර බඹසරය
මහත්තයෝ
පිරිමි බහුතරය තාම තනිකඩ යි
කසාදයක් බැඳ ගනු නොහැකි ව

අචිනි රෙෆ්ලිකා වීරක්කොඩි
සිව්වන වසර
කොළඹ විශ්වවිද්‍යාලය
achinireflika72@gmail.com

9 772950 655005